23/05/2012 - ලංකාදීප

**ආර්ථිකයට ගැළපෙන සමාජ පරිවර්තනයක් - මිලින්ද මොරගොඩ**

පවතින ආර්ථිකය ගැටලු සහගතයි. ජන ජීවිතයට දැනෙන්නේ වෙහෙසක්. අලුත් ආර්ථිකයක් ගොඩනගන්නේ කොහොමද? ආර්ථිකය සකස් වෙන්නේ ධනය බිහි කිරීමෙන්. ආණ්ඩුවට ධනය බිහිකරන හැකියාව අඩුයි. ආණ්ඩු ධනය බෙදාගැනීමට දක්ෂයි. බෙදාගන්නට කලින් බිහිකරන්න අවශ්‍යය. නිදහස ලැබීමෙන් පසු ගතවූ දශක හය තුළ අත්හදා බැලීම් සිදුවුණා. වර්තමාන පෙන්වන්නේ එකී අත්හදා බැලීම්වල විවිධ නශ්ඨාවශේෂය. එකී නටඹුන් අතරින් පෙනෙන එකම ලක්ෂණය මෙම ආර්ථිකය යටත් විජිත උරුමයට වහල් බවයි. නිදහසලැබූ නමුත්, ලාංකික අනන්‍යතාවය ගොඩනගන්නට පාලනය කරන ලද නායකයන් ගත් උත්සාහ හමුවේ ආර්ථික නිවහල් බවක් රටට ලැබී නැත. අලුත් යුගයක් උදා කරන්නට නම් පැරණි රාමුව අවබෝධකර ගත යුතුය.

ශ්‍රී ලංකාව යටත්කරගෙන සිටි බටහිර ප්‍රජාව ලංකාවේ ආර්ථිකය ගොඩනගන ලද්දේ ඔවුන්ට උවමනා පරිදිය. විශේෂයෙන් බ්‍රිතාන්‍ය යුගයේ දී මෙය කැපී පෙණුනි. ආර්ථිකය රජුගේය. සියලු දේ රජුට අයත්ය. යටත් විජිත භාවයෙන් මිදී ඇතත් රජ භූමිකාව වෙනුවට අද මතුවී නැගී ඇත්තේ රජයයි. පක්ෂ දේශපාලනය හා පක්ෂ අනුගාමිකයන් බිහිවී ඇත. රජය රජුට අයත් දේ සංකේතවත් කරයි. රජයට යටත්ව, රජය කියන ආකාරයට, රජය යටතේ යැපෙන්නට අපගේ මානසිකත්වය සැකසී ඇත. රජයට බැඳීමක් නැති නිවහල්ව ගොඩනැගෙන්නට සමත් පුරවැසියන් බිහිකිරීම නිවහල් බවයි.

ලංකාව යටත් කරගැනීම සමග මෙරට සම්පත් ඔවුන්ට බටහිරට අවමනා පරිදි හැසිරවීය. එය බලහත්කාරයයි. මුලින් කෝපි වගාව ඇරඹීය. එය අසාර්ථක වන විට චීනයෙන් තේ පැල ගෙනැවිත් වගා කළේය. රබර් වගාව ඇතිකරන ලද අතර මිනිරන් ද එකතු කළේය. මාර්ග තැණුනේ දුම්රිය මග ඉදිවුණේ යටත් විජිත උවමනාව අනුවය. සංචාරක ව්‍යාපාරයට ඔබින වෙරළ තීරය වෙරළබඩ දුම්රිය මගට යටවීමෙන් අදටත් එහි වාසි අහිමිය. රට තුළ ආර්ථිකය ඔවුන්ට රිසි පරිදි විය. බලය හා ධනය අධිරාජ්‍යවාදින්ට අයත්ය. දේශීය ව්‍යවසායකයන්ට ස්වාධීනව බිහිවෙන්නට ඉඩ දුන්නේ නැත. ඔවුන්ගේ දර්ශනයට එකග කුඩා පිරිසට එය පිරිනැමුණේ බලපත්‍ර ක්‍රමයටය. යටත් විජිත පාලනය මත යැපෙන ආකාරයටය. අධිරාජ්‍යවාදීහු බලයට හා ධනයට එකටඑකතු වන්නට ඉඩදුන්නේ නැත. බලය ඔවුන් අතය. ධනය බිහිකරන අවස්ථාවද පාලනය කළේය. නිදහසේ ධනය උපදවන්නට සමාජයට අවස්ථාව ලැබීමෙන් ධනය හා බලය එකතු වන අතර එය පවත්වාගෙන යන ක්‍රමයට අභියෝගයක් වන බව ඔවුහු දැන සිටියහ. ධනය නිපදවන ව්‍යවසායකත්වය පාලනය කළ අතර එය බලය ආරක්ෂා කරගැනීමට ඉවහල්විය.

බලය ආරක්ෂා කර ගැනීමට ධනය බිහිකරන ව්‍යවසාය පාලනය කළ නමුත් එය එක්තරා අවස්ථාවක දී සීමාව ඉක්මවා ගියේය. ඉන්දියානු නිදහස් සටන සහ මෙරට ව්‍යාපාර හිමිකරගත් බටහිරට ලැදි පිරිසගේ දරුවන් බටහිර අධ්‍යාපනය ලැබීම එහි ප්‍රධාන අදියරකි. අලුත් අදහස් අලුත් ආකල්ප සහිත මෙම කණ්ඩායම නිදහස දිනාගන්නට මුල පුරන විට එයට පදනම වූයේ බටහිර අනුදැනුම ඇතිව මෙරට ධනය බිහිකළ පෙලැන්තියයි.

නිදහස ලැබීමෙන් පසු රාජ්‍ය බලය රටට හිමිවිය. නමුදු ධනය බිහිකරන හා ව්‍යවසාය පාලනය කිරීමේ අධිපතිවාදය තවදුරටත් ආණ්ඩුව සතු එකක් ලෙස එලෙසම පවත්වාගෙන ගියේය. රජු වෙනුවට රජය බිහිවිය. බලය ආරක්ෂා කර ගැනීමට ධනය උපයන කණ්ඩායම නිසි පාලනයකට යටත්ව පවත්වා ගැනීම වැදගත් යැයි බලය අත්පත්කර ගත් කණ්ඩායම කල්පනා කරන්නට ඇත. බලය ලබාගත් පෙලැන්තිය එය ආරක්ෂා කරගත්තේ ධනය උපයන මාර්ග විවෘත නොකිරීමෙන්ය. එයින් සිදුවූයේ බලය හා ධනය යන

අංග දෙක එක සමාජ පෙලැන්තියකට සමණක් සීමාවීමයි. අදටත් බලය ඇති තැනට ධනය බිහිකරන පුද්ගලයන් එකතු වන අතර එලෙස එකතු නොවන පිරිසට බලය හිමි කණ්ඩායමෙන් බාධා සිදුවෙයි.

ආර්ථිකයක් දියුණු කරන්නට නම් නිදහසේ ධනය බිහිකරන්නට ඉඩ දිය යුතුය. එයට ව්‍යවසායකත්වය හා අලූත් අවස්ථා සොයාගැනීම වැදගත්ය. ඇමරිකාවේ සිලිකොන්වැලි ප්‍රදේශය ලෝකයේ අලූතෙන් නිර්මාණ බිහිවෙන තැනෙකි. බාධාවකින් තොරව අවස්ථා ඇති සමාජයක් ලෙස පිළිගැනේ. අලූත් අදහස් ඇති අය එහි පැමිණ ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගනිති. ඇමරිකාව අලූත් රටකි. එහි පුද්ගලයාගේ පසුබිම නොසලකයි. ඕනෑම රටකින් දක්ෂයන් ගෙන්වා ගනී. ග්‍රීන්කාඩ් ක්‍රමය ද එවැන්නකි. දක්ෂතා ඇති හොඳ අධ්‍යාපනයක් සහිත පුද්ගලන්ට දොරටු විවර කරන ඇමරිකාව ඔවුන්ගේ දැනුම, ව්‍යවසායකත්වය ඇමරිකාවේ දියුණුවට උපයෝගී කර ගනිති. ධනය බිහිවෙන්නේ අලූත් දෙයකින්ය. අලූත් ව්‍යවසායයකින්ය. ආර්ථිකයක් දියුණු කරන්නට නම් අලූත් දේ සොයා යා යුතුය. අපේ රටට ද වැදගත්වන පාඩම එයයි. 1970 දි පමණ සමාජ බලවේග අධිරාජ්‍යවාදී රාමුව වෙනුවට සමාජවාදී දැක්මක් රටට ඇති කරන්නට උත්සාහ කළේය. මෙයින් පන්ති පරතරය නැති කරන්නට උත්සාහ කළේ ඉහළ මට්ටම් වල පිරිස පහලට ඇද දැමීමෙන්ය. ලෝකය පුරා සංකල්පයක් වශයෙන් එය අසාර්ථක විය. 1977 දී තවත් අලූත් ව්‍යුහයක් සකස් කරන්නට උත්සාහ කළේය. නමුත් රට තුළ ප්‍රමාණවත් ආර්ථික නිදහසකට සුදුසු වාතාවරණයක් බිහිවීමටඇති ඉඩ ගැටුම් සහ ත්‍රස්තවාදී ක්‍රියා මගින් අවහිර කරනු ලැබීය. ව්‍යවසායකත්වය ඇති කරිම හා ධනය බිහිකිරීමට සමාජය සම්බන්ධකර ගන්නා අරමුණ සම්පූර්ණයෙන් ආපසු හැරිණ. යුද පරිසරය තුළ ආරක්ෂාව වැදගත්විය. ආරක්ෂාව රජයේ වගකීමකි. නැවතත් රජය බලවත් කිරීම විනා ව්‍යවසායකත්වය වර්ධනය කර ජන සමාජය බලවත් කරන තීන්දුවකට යාම වැලකිණ. යුද පසුබිම අවසන්ය. අලූත් යුගයකට අවතීර්ණ විය යුතුය. හුදෙක් එය ගැටුම් අවසානයේ දී ආර්ථිකය වර්ධනය කරන මග සැලසීම පමණක් නොවේ. රටට ගැලපෙන නව රාමුවක් සකස් කිරීමයි. අධිරාජ්‍යවාදී පාලනයේ සිට පැවත එන නිදහසේ ධනය නිර්මාණය කිරීමට එරෙහිවන බලපෑම ඉවත් කිරීමයි.

තේ, රබර්, පොල් ඇතුළු කෘෂි ආර්ථිකය අවුරුදු සිය ගණනක් පැරණිය. ඇගලූම් කර්මාන්තය, විදේශ රැකියා වැනි අංශ පවා දශක හතරකට පැරණි යුගයේ ධනය උත්පාදනය කරන අංගය. ලෝකයේ ධනෝත්පායන මාර්ග වෙනස්වී තිබේ. රටට හා සංස්කෘතියට ගැලපෙන අන්දමට නව මං සොයා යන්නට කාලය උදා වී ඇත. එයට අවස්ථාව සැපයිය හැකි වන්නේ ව්‍යවසායකයන් ඇති වන්නට ඉඩ හැරීමෙන්ය. අලූත් අලූත් දෑ නිපදවන්නට ඉඩ දීමෙන්ය. තවමත් රට පාලනය වන්නේ නිදහසේ වැසියන්ට සිතන්නට හෝ වැඩ කරන්නට අවසර නැති පරිසරයකය. බාධාව අවසර පත්‍රයයි. රජයේ බලපත්‍ර ක්‍රමයයි. අවසරය, බලපත්‍රය රහිත සමාජ ක්‍රමයක් ගැන සිතන්නට බිය මන්ද? බලය ඇති පෙලැන්තිය ආර්ථිකය නැගෙන්නට ඇති මගට පනවා ඇති බාධා ඉවත් කළ යුතුය.

මලයාසියාව ගොඩනගන විට එරට හිටපු අග්‍රාමාත්‍ය වෛද්‍ය මහතීර් මොහමඩ් මහතා එම තීන්දුවේ සිටියේය. මැලේ ජාතිකයන්ට පුලූවන් කියන විශ්වාසය ඔහු ගොඩනැගීය. එයට මග සකස් කරගත්තේ ආත්ම ධෛර්යය ඇතිකිරීමෙන්ය. අපේක්ෂා භංගත්වයට පත්ව සිටි මැලේ ජාතිකයන් දිරියවත්කරන්නට නොයෙක් උපා යෙදීය. මැලේ ජාතිකයාට ලෝකයේ ඕනෑම දෙයක් පරදවන්නට හැකිය යන විශ්වාසය ඇති කිරීම සමග ආර්ථික ප්‍රතිසංස්කරණයක් කළේය. ආයෝජකයන්ගේ පැත්ත ගෙන ඔවුන්ට තිබුණ ප්‍රශ්න නිරාකරණය කළේය. එහි ප්‍රතිඵලය වූයේ පුද්ගලික අංශය ක්‍රියාශීලී වීමයි. එයින් බිහිවූ ධනය සමාජය දියුණු කළ අතර එයින් අය කරන ලද බදු රටේ යහපතය යෙදවීය. ධනය බිහිවන විට එය බලයට අභියෝගයක් බවට පත් කරන්නට ඔහු ඉඩ දුන්නේ නැත. සාමාන්‍යයෙන් ඕනෑම රටක බලවත් ධනවතුන් බිහිවනවිට එකී කණ්ඩායම් ආණ්ඩු බලයට අත පොවනු ඇතැයි සැකයක් ඇත. දුප්පත් රටවල එය විශේෂය. බලය හා ධනය සමබරව පාලනය කරන්නට හැකි අවස්ථාවේ දී රටවල් දියුණුවට පත්වෙයි.

පසුගිය වසර තිහ තුළ රට තුළ පැවති යුද ගැටුම් ආර්ථිකයට විශාල හානියක් විය. එය පිළිකාවක් ලෙස මර්මස්ථාන දුබල කළේය. යුද ගැටුම් උත්සන්න අවධියේ වසරක ආරක්ෂක වියදම ඇමරිකානු ඩොලර් බිලියන දෙක ඉක්මවා ගියේය. ත්‍රස්තවාදය නොවේ නම්, වසර ගණනක් පවත්වාගෙන ගිය ආරක්ෂක වියදමෙන් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය වැනි දැවැන්ත යෝජනා ක්‍රම අවුරුද්දක් පාසා අරඹන්නට හැකියාව තිබිණ. යුද වියදම් අවසන් වියයුතු අතර එයින් ඉතිරිවන රජයේ මුදල් ආර්ථිකය ගොඩනගන්නට වැයකරන්නට අවශ්‍යය. තවමත් එවැනි විශාල ධනයක් රටේ දියුණුවට රට තුළින් ආයෝජනය වන බවක් තවමත් පෙනෙන්නට නැත. දැනට සිදුවෙමින් ඇත්තේ ආණ්ඩුවේ ආදායමින් ජනතාව යැපෙන මගක් සකස්කිරීමයි. ආණ්ඩුවේ සේවකයන් සමග ජනගහනයෙන් විශාල පිරිසක් රජයෙන් යැපෙන තත්ත්වයට පත්ව තිබේ. තව තවත් ආණ්ඩුවට බඳවා ගැනීමට තීන්දු කරන්නේ නම් එම පිරිස නඩත්තු කරන්නට සිදුවන්නේ ද ආණ්ඩුවටමය. යුද පරිසරය අවසන් වී ඇත් අවස්ථාවේ විනය, දක්ෂතාවය හා අත්දැකීම් ඇති ආරක්ෂක අංශ වල පිරිස ව්‍යවසායකයන් බවට පත් කරන්නට විධිවිධාන යෙදිය යුතුය. එවිට ආර්ථිකයට ගැලපෙන සමාජ පරිවර්තනයක් සිදුවෙයි. තමන්ගේ බලයෙන් ජනතාව නඩත්තු කරන විට මහජනතාව එයට හුරු වන අතර ව්‍යවසායකත්වයක් බිහි වන්නේ නැත. ආණ්ඩුවේ සේවය වෙනුවෙන් කරන බඳවා ගැනීම් නිසා ආයතන විශාලය. ඒවායෙන් යැපෙන පිරිස හෙයින් ආයතන අකාර්යක්ෂමය. අඛණ්ඩව අලාභ ලබයි. තරගකාරීත්වයක් නැත. මෙහි ප්‍රතිඵලය ආණ්ඩුවේ ආයතන වලට සමාන්තරව ඇති පුද්ගලික අංශය අධික ලාභ ඉපැයීමයි. මූල්‍ය ක්ෂේත්‍රය එයට හොඳ උදාහරණයකි. සහනාධාර තවත් පැත්තකි. එයින් වියදම් වැඩිවෙයි. ආදායම ප්‍රමාණවත් නොවන විට ණය ගන්නට සිදුවෙයි. ආණ්ඩුව තමන්ට දැරිය හැකි උපරිම ණය සීමාවට පැමිණ තිබේ. ණය ගැනීමෙන් බැංකු පොලිය ඉහළ යයි. උද්ධමනය පාලනය කරගත නොහැකිවෙයි. අවසානයේ එහි වන්දිය ගෙවන්නේ පොදු මහජනතාවය. මෙම තත්ත්වය අවබෝධ කරදී රාජ්‍ය අංශයේ විශාල ප්‍රතිසංස්කරණයකට වහාම යා යුතුය. ආණ්ඩු ණය ගෙන මහජනතාව නඩත්තු කිරීම වෙනුවට මහජනතාව ව්‍යවසායකයන් කළ යුතුය. නිෂ්පාදකයන් බවට පත් කළ යුතුය. පුද්ගලික අංශයට ව්‍යාපාර අරඹන්නට ඉඩ දී ඔවුන්ට ප්‍රාග්ධන පහසුකම් ගන්නට හැකිවන පරිදි මූල්‍ය අංශය විප්ලවීය ප්‍රතිසංස්කරණයකට යාම අවශ්‍යය. ගැටුම් අවසන්වීමෙන් පසු ඉතිරි කරගන්නා ආරක්ෂක වියදම මහජනතාව නඩත්තුවට නොව, සංවර්ධනයට හා ආර්ථික ප්‍රතිසංස්කරණයකට යෙදවීම වැදගත්ය.

නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් හදා වඩා ගන්නා පරම්පරාව ලෝකයේ නොයෙක් රටවල් දියුණු කරන්නට වැඩකරන අතර ආපසු රටට එන්නේ එයින් උපයා ගන්නා සුළු ආදායම රැගෙනය. රට තුළ අවස්ථා නැති සමාජය අපේක්ෂා ඉටු කරගන්නට බලා සිටින්නේ විදේශගත වීමෙන්ය. තවත් කොටසක් ආණ්ඩුවට එකතුවීමේ අරමුණ ඇතිව සිටී. ඇමතිවරුන්ගේ සමත්කම ලෙස සමාජය සලකන්නේ ඔවුන් සපයන ලද ආණ්ඩුවේ රැකියා ප්‍රමාණයයි. විදේශ රැකියා දෙන්නට හැකිවූ ආකාරයයි. ආණ්ඩුවේ රැකියාව බලා සිටින කොටස නඩත්තු කරන්නට වෙන්නේ ආණ්ඩුව සමාජයෙන් අයකරගන්නා බදු වලින්ය. ආණ්ඩුවලින් යැපෙන, දරුවන් රට යවන නව වහල් බවින් ක්‍රමයෙන් මිදෙන්නට එයට අවශ්‍ය පරිසරය රට තුළ ගොඩනැගිය යුතුය. යටිතල පහසුකම්, ප්‍රතිපත්ති හා නීති රීති සම්පාදනය එහිලා වැදගත්ය. ආකල්ප වෙනස් කිරීම වැදගත්ය. ලෝකයේ බොහෝ රටවල ඇමතිවරයා ගේ හෝ ප්‍රතිපත්ති සම්පාදකයාගේ දක්ෂතාවය මනින්නේ සමාජය තුළ අලුතින් ජනනය වන ව්‍යවසාය ප්‍රමාණය අනුවය. ආණ්ඩුවේ රැකියා රටට බරක් බව ඔවුහු දනී. ප්‍රධාන වශයෙන් දේශපාලන බලය හා ධනය බිහිකිරීමට ව්‍යවසායකත්වයට ඉඩ දෙන රාමුව අතර ඇති යටත්විජිත යුගයේ සිට පැවත එන බලවේග පරාජයට පත්කළ යුතුය. එය කළ හැකි වන්නේ පුලුල් ආකාරයට විහිදෙන දැක්මකින් පමණකි. එයට සමාන්තරව සමාජයේ ආකල්ප වෙනසක් ද සිදුකිරීම අවශ්‍යය. අධිරාජ්‍ය වාදීන්ගෙන් යැපුන යුගය වෙනුවට ආණ්ඩුවෙන් යැපෙන ආකල්ප අවසන්කළ යුතුය. අධිරාජ්‍යවාදී යුගයේ දී පාලකයන් වැසියන් ආරක්ෂා කළේ ස්වකීය වහලුන් වශයෙන්ය. නිවහල් රටක වැසියන් රජයෙන් යැපෙන මානසිකත්වයක, ආණ්ඩුවේ රැකියා, ආණ්ඩුවේ

සහනාධාර බලා සිටිය යුතු නැත. තමන්ට හිමි පංගුව වෙනුවට රටට කළ හැකි යුතුකම ගැන සිතන පරපුරක් බිහිකිරීම අද යුගයේ බලකිරීමයි. ජනතා පදනමක් ඇති ආකාරයට පැරණි සංකල්ප විනාශ කර විනිවිද භාවයක් ඇතිව අලුත් ආකල්ප වගා කරන්නට විශාල ආත්ම ශක්තියක් අවශ්‍යය. වත්මන් ආණ්ඩුවටබලය තිබේ. විශාල නායකත්වයක් ඇත. ත්‍රස්තවාදය පරාජය කරන්නට රට එකමුතු කරන්නට හැකි වූ වත්මන් ආණ්ඩුවට මෙම පරිවර්තනය වෙනුවෙන් රට එකතු කිරීම අපහසු නැත.

සාධාරණව ධනය ඉපැයීම පොදු ජනතාවගේ අපේක්ෂාව විය යුතුය. එයට ඉඩ ඇත්තේ ව්‍යවසායකත්වය හා අලුත් සොයා ගැනීම් වලට ඉඩදීමෙන් පමණකි. රටේ ඉතිරිව ඇති සම්පත් බෙදා ගැනීමට සටන් කරන හා ඒ වෙනුවෙන් බලය ඉල්ලන පියවර අහෝසි කිරීම අද අවශ්‍යතාවයයි. සාර්ථක රටවලින් මෙයට පාඩම් ඉගෙන ගත හැකිය. මහජනතාවට අවස්ථාව දුන් සියලූ රටවල් ඉදිරියට පැමිණ තිබේ. එම රටවල මහජනතාව නඩත්තු වන්නේ ආණ්ඩුවේ වියදමින් නොවේ. යැපෙන මානසිකත්වය එම රටවල මහජනතාවට නැත. සුළු කොටසක් ධනය නිපදවන්නට සම්බන්ධ වී බහුතරයක් ආණ්ඩුවෙන් යැපෙන රටකට පැවැත්මක් නැත. අලුත් අලූත් දේ සොයා නොයන ජාතියක් ලොව නොනගී යැයි කුමාරතුංග මුනිදාස ශූරීන් දුන් පණිවුඩය මෙයයි. ජනතාවට ඉදිරියෙන් සිතන්නට හැකි පාලකයකින් තොරව අලූත් සමාජයක් බිහිකරන්නට නොහැකිය. පරිවර්තනයකට මග සකස්වන්නේ ජනතාව කැපවීමෙන් තමන් ක්‍රමය තුළ කොටස්කරුවන් වන දිනයේ දීය. මේ ගැන ඔබගේ අදහස email@milinda.org මගින් සංවාදයට යොමු කළ හැකිය.